// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1798/8 — 2013 පෙබරවාරි මස 18 වැනි සඳුදා - 2013.02.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

මගේ අංකයඃ 01/10/03/04.

**ඌව පළාතේ පළාත් සභාව**

ඌව පළාත් ආණ්ඩුකාරවරයා විසින් කරන ලද පත්කිරීම්

ඌව පළාත් ආණ්ඩුකාරවර ගරු සී. නන්ද මැතිව් මැතිතුමා විසින් පහත සඳහන් පත්කිරීම් සිදු කර ඇති බව මෙයින් නිවේදනය කරමි.

01. ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ විශ්‍රාමික නිලධාරී සී. දිසානායක මහතා 2013.01.01 වැනි දින සිට ඌව පළාත් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුවේ ගණකාධිකාරී තනතුර සඳහා ස්ථිර නිලධාරියෙකු පත් කරන තෙක් හෝ 2013.12.31 වැනි දින හෝ යන දෙකෙන් කලින් එළඹෙන දිනය දක්වා පමණක් එම තනතුරේ කොන්ත්‍රාත් පදනම මත නැවත සේවයේ යෙදවීමට,

02. ඌව පළාත් සභාවේ මාර්ග සංවර්ධන, නිවාස, ජල සම්පාදන, පාරිභෝගික කටයුතු හා සමුපකාර සහ ආහාර සැපයීම් හා බෙදා හැරීම් අමාත්‍යාංශයේ ලේකම් එම්. ඒ. බී. දයා සෙනරත් මහතා 2013.01.24 වැනි දින සිට 2013.01.31 දින දක්වා විදේශ ගත වන බැවින්, 2013.01.24 දින සිට ඒ මහතා නැවත දිවයිනට පැමිණෙන තෙක්, ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I වන පන්තියේ නිලධාරි ඩබ්. එම්. එම්. ජී. අබේසිංහ බණ්ඩා මහතා, තම නිත්‍ය තනතුරට අතිරේකව ඌව පළාත් සභාවේ මාර්ග සංවර්ධන, නිවාස, ජල සම්පාදන, පාරිභෝගික කටයුතු හා සමුපකාර සහ ආහාර සැපයීම් හා බෙදා හැරීම් අමාත්‍යාංශයේ ලේකම් තනතුරේ වැඩ බැලීමට,

03. ශ්‍රී ලංකා ක්‍රම සම්පාදන සේවයේ නිලධාරි එම්. එම්. ආනන්ද විජිත කුමාර මාපා මහතා 2013.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි, තම නිත්‍ය තනතුරට අතිරේකව ඌව කළමනාකරණ සංවර්ධන පුහුණු ආයතනයේ සහකාර අධ්‍යක්ෂ තනතුරේ රාජකාරි ඉටු කිරීමට,

04. ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ විශ්‍රාමික නිලධාරි ශ්‍රී. ධ. අභයකෝන් මහතා 2013.02.10 වැනි දින සිට ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුර සඳහා ස්ථිර නිලධාරියෙකු පත් කරන තෙක් හෝ 2014.02.09 වැනි දින හෝ යන දෙකෙන් කලින් එළඹෙන දිනය දක්වා පමණක් එම තනතුරේ කොන්ත්‍රාත් පදනම මත නැවත සේවයේ යෙදවීමට,

1A - PG 001563 — 385 (2013/02)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

05. ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ විශ්‍රාමික නිලධාරි එච්. එස්. යාපා මහතා 2013.01.10 වැනි දින සිට ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ (ඉංග්‍රීසි) තනතුර සඳහා ස්ථිර නිලධාරියෙකු පත් කරන තෙක් හෝ 2013.09.09 වැනි දින හෝ යන දෙකෙන් කලින් එළඹෙන දිනය දක්වා පමණක් එම තනතුරේ කොන්ත්‍රාත් පදනම මත නැවත සේවයේ යෙදවීමට,

06. ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවයේ විශ්‍රාමික නිලධාරි ඩබ්ලිව්. එම්. අත්තනායක මහතා 2013.01.28 වැනි දින සිට නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය) තනතුර සඳහා ස්ථිර නිලධාරියෙකු පත් කරන තෙක් හෝ 2014.01.27 වැනි දින හෝ යන දෙකෙන් කලින් එළඹෙන දිනය දක්වා පමණක් එම තනතුරේ කොන්ත්‍රාත් පදනම මත නැවත සේවයේ යෙදවීමට,

07. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I වන පන්තියේ නිලධාරිනී ආර්. ඒ. එච්. ඒ සමරසිංහ මහත්මිය 2013.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි තම නිත්‍ය තනතුරට අතිරේකව, නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) තනතුරේ වැඩ බැලීමට.

එච්. එම්. සෝමතිලක,
ඌව පළාත් ආණ්ඩුකාරවර ලේකම්.

රජ වීදිය,
බදුල්ල,
ඌව පළාත් ආණ්ඩුකාරවර කාර්යාලයේ දී ය.

03 - 289

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.